

# සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය

මොහාන් පණ්ඩිතගේ

වර්ධනය වන අභියෝග සහ, රට තුළ පවතින දුෂ්කරතා හමුවේ වුවද, ධනාත්මක සමාජ-ආර්ථික වෙනසක පුරෝගාමියෙකු ලෙස නැගී සිටිමින්, අඛණ්ඩ මෙහෙයුම් මෙන්ම ජීවිත සහ ජීවනෝපායන් සමෘද්ධිමත් කරලීමට, හේලීස් පවුල නිබඳ සහයෝගය දැක්වූවේය.

**විශේෂ කඩඉම්**

- සමූහය විසින් මෙහෙයුම් ඉතිහාසයේ ඉහළම ආදායම සහ බදුවලට පෙර ලාභය වාර්තා කිරීම
- ශ්‍රී ලංකාවේ අංක 1 ආයතනය ලෙස බිස්නස් ටුඩේ ටොප් 40 විසින් ශ්‍රේණිගත කරනු ලැබීම
- ධනාත්මක සමාජ- ආර්ථික වෙනසක පුරෝගාමියෙකු වීම
- ආයතනික පරමාර්ථ ප්‍රකාශය එළිදැක්වීම

හේලීස් සමූහය විසින් මෙතක් මෙහෙයුම් ඉතිහාසයේ වාර්තා කළ ඉහළම ආදායම සහ බදු ගෙවීමට පෙර ලාභය පිළිවෙළින් රුපියල් බිලියන 487.43 ක් සහ රුපියල් බිලියන 42.75 ක් වාර්තා කළ බැව් සතුටින් දන්වා සිටින අතර එය අපගේ නොසැලී සිටීමේ හැකියාව මෙන්ම ශක්තිය පිළිබිඹු කරන ලද වසරක් විය. දශක ගණනාවක් පුරා අප විසින් මින් පෙර අත් නොවිඳි අතිශය අස්ථාවර, අනපේක්ෂිත පසුබිමක වුවද, පාර්ශ්වකරුවන්ගේ පුළුල් ජාලය වෙත නිරන්තරයෙන් වටිනාකම් නිර්මාණය සහතික කිරීම සඳහා හේලීස් සමූහය විසින් එහි ඉමහත් කැපවීමක් සහ කාර්යක්ෂමතාවයක් දක්වන ලදී. මනා නායකත්වය සහ කණ්ඩායමේ සුවිශේෂී ආකල්ප ඒ සඳහා පිටිවහලක් විය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා හේලීස් පීඑල්සීහි 10 වෙනි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ මා විසින් ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

සමාලෝචිත වර්ෂය තුළ, සමූහයේ වටිනාකම්, ශක්තිය සහ නොසැලී සිටීමේ හැකියාව අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. වර්ධනය වන අභියෝග මෙන්ම, රට තුළ පවතින දුෂ්කරතා හමුවේ වුවද, ධනාත්මක සමාජ-ආර්ථික වෙනසක පුරෝගාමියෙකු ලෙස නැගී සිටිමින්, අඛණ්ඩ මෙහෙයුම් මෙන්ම ජීවිත සහ ජීවනෝපායන් සමෘද්ධිමත් කරලීමට, හේලීස් පවුල විසින් නිබඳ සහයෝගය දක්වන ලදී. නව්‍ය, ගතික සහ නොසැලී සිටින ව්‍යාපාරයක් ලෙස එහි තිරසාරභාවය සනාථ කරමින්, හේලීස් පීඑල්සී විසින් නැවත වරක් ශ්‍රී ලංකාවේ අංක 1 ආයතනය ලෙස බිස්නස් ටුඩේ ටොප් 40 විසින් පිළිගැනීමට ලක් වූ බව මම සතුටින් දන්වා සිටිමි.

### පරමාර්ථය මූලික කරගත් ආයතනයක් ඔස්සේ

ආයතනික අරමුණු යනු දුෂ්කර කාලවලදී අත්‍යවශ්‍ය, ඒකාබද්ධ ශක්තියකි. වසර තුළදී, හේලීස් පීඑල්සී විසින් සමාගමේ විවිධ මට්ටම් පුරා සාමූහිකව ගැටලු විසඳීම, අදහස් උත්පාදනය සහ විවාද ආදිය ඇතුළත් පරිපූර්ණ සහ ක්‍රමානුකූල ක්‍රියාවලියක් ඔස්සේ නිර්මාණය කරන ලද 'සහසබැඳියාවෙන් යුතු සමෘද්ධිමත් හා හරිත ලොවක් ගොඩනංවමු' එහි අරමුණ එළිදක්වන ලදී. පුළුල් ආර්ථික, සමාජීය සහ පාරිසරික සන්දර්භය තුළ ගුණාත්මකභාවය ඇති කිරීමේ අපගේ අභිලාෂයන් මෙම අරමුණු මඟින් සංකේතවත් කරනු ලබයි. එය දිගු කාලීනව සමාග මේ උපායමාර්ග සහ වටිනාකම් නිර්මාණය කිරීමේදී මූලිකත්වය ගනු ඇත. සමූහයේ සියලුම අංශ විසින් වසර තුළ ඔවුන්ගේ අරමුණු සකස් කොට ඉදිරිපත් කරන ලද අතර, එමඟින් අපි මෙහෙයුම් සිදු කරනු ලබන ආකාරය මෙන්ම දිගු කාලීනව අපගේ පාර්ශ්වකරුවන්ට ලබා දීමට අරමුණු කරන දේ පිළිබඳ වූ දැක්ම පැහැදිලි කරනු ලබයි.

### අවදානම්, යථාර්ථයන් සහ බලාපොරොත්තු

වසර තුළ සමස්ත අභියෝගවල අනපේක්ෂිතභාවය මෙන්ම බරපතලකම පිළිබඳ සංවේදී වීම සහ නිසැක තීරණ ගැනීම සඳහා ව්‍යාපාර නායකයින්ගේ විශේෂ මැදිහත්වීමේ අවශ්‍යතාවය වැඩි විය. ගෝලීය වශයෙන්, කොවිඩ්-19 සහ භූ දේශපාලන අස්ථාවරයන් ඇතුළුව අඛණ්ඩව වසර තුනක පවතින බාධාවන්වල සාමූහික බලපෑම් හේතුවෙන් භාණ්ඩ මිල ඉහළ යාම, මූල්‍ය අංශයේ කැළඹීම්, පවතින සැපයුම් දාම ගැටලු සහ උද්ධමනය ඉහළයාම ඇතුළු අනපේක්ෂිත බාධා කිරීම් දැකගත හැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී දියුණු ආර්ථිකයන් සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් යන ද්විත්වයෙහිම වර්ධනය පහත වැටීමත් සමඟ ගෝලීය වර්ධනය මන්දගාමී විය.

අභ්‍යන්තර මට්ටමින්, වසර තුළදී නිවෙස්, ව්‍යාපාර සහ රජය සැලකිය යුතු දුෂ්කරතාවකට යොමු කරමින් ශ්‍රී ලංකාව අනපේක්ෂිත සාර්ව-ආර්ථික අභියෝග රැසකට මුහුණපෑවේය. බාහිර බලපෑම් මඟින් තීව්‍ර වූ මූල්‍ය සහ ජංගම ගිණුම්වල ද්විත්ව හිඟයන් ඇතුළු ව්‍යුහාත්මක අසමතුලිතතාවයන් හේතුවෙන් අර්බුධකාරී තත්ත්වයන් ඇති විය. 2022 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව විදේශ ණය සේවා අත්හිටුවීමක් ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ස්වෛරී ණය සහ ගෙවුම් ශේෂ පීඩනයක් ඇති විය. පසු බලපෑම් හේතුවෙන් සියලු අංශයන්හි ආර්ථික ක්‍රියාකාරකම් අකර්මණ්‍ය වූ හෙයින්, රටේ දළ දේශීය නිෂ්පාදිතය (GDP) 2022 දී 7.8% කින් සංකෝචනය විය. මහජනතාව මුහුණ දුන් දුෂ්කරතා පාදක කොට ගෙන ඇති වූ විරෝධතා සහ සමාජ නොසන්සුන්තා හේතුවෙන්, 2022 වර්ෂයේදී දේශපාලන අස්ථාවරත්වය සහ දේශපාලන නායකත්වයේ බහුවිධ වෙනස්කම් ඇති විය.

අර්බුද තත්ත්වය වර්ධනය හේතුකොට, සැපයුම් දාම බිඳවැටීම, ආනයන සීමා කිරීම්, විදේශ විනිමය හිඟය සහ ආනයනික අමුද්‍රව්‍ය මෙන්ම වෙළඳ භාණ්ඩ සැපයීමට බලපාන ලද ණයවර ලිපි හඳුන්වාදීමේ අභියෝග හේතුවෙන් ව්‍යාපාරික ක්‍රියාකාරකම් අඩාල විය. වෙනස්වන පාරිභෝගිකයින් සහ ව්‍යාපාරික විශ්වාසයන් පීඩාවට පත් කළ, ප්‍රවාහනය සීමා කිරීම්, වරාය තුළ ඇති වූ ප්‍රමාදයන්, ඉන්ධන හිඟය සහ විදුලි සැපයුමට බාධා කිරීම් වැනි බොහෝ ගැටලු හේතුවෙන් ව්‍යාපාර දෛනික මෙහෙයුම් අභියෝග යන්ටද මුහුණ දුන්නේය.

මෙම පසුබිම තුළදී වුවද, අර්බුදයේ වැඩිදුර බලපෑම් ඇති වීම වළක්වාලීම සඳහා රජය සහ මහ බැංකුව විසින් සම්බන්ධීකරණය කරන ලද ප්‍රතිපත්තිමය මැදිහත්වීම් යොදා ගැනීම සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන්, 2022 ජනවාරි සිට 2023 මාර්තු දක්වා ප්‍රතිපත්තිමය ණය අනුපාතය පදනම් අංක 1,050 කින් ඉහළ යන ලදී. මේ හේතුවෙන් AWPLR ණය අනුපාතිකය, 2022 අප්‍රේල් මස 13.02% ක් සිට 2022 නොවැම්බර්හිදී 28.25% කට වර්ධනයක් දක්වමින්, ඉන් පසු මාස වල අඩු වීමක් දක්වමින්, 2023 මාර්තු වන විට 21.40% ක් සමඟින් වෙළඳපොළ පොලී අනුපාතික ශීඝ්‍රයෙන් ඉහළ යන ලදී. මෙහෙයුම් පිරිවැය සහ ලාභදායිත්ව ආන්තිකයන් මත පීඩනයක් ඇති කරමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2022 සැප්තැම්බර් මස 69.8% කින් වර්ධනය වීමත් සමඟ වසර තුළ උද්ධමනය ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. ඉහළ යන උද්ධමනය වැය කළ හැකි ආදායම, ආහාර සුරක්ෂිතතාවය හා ජීවන තත්ත්වය සඳහා දැඩි බලපෑමක් ඇති කළ අතර, දරිද්‍රතා මට්ටම දෙගුණ විය.

රාජ්‍ය විදේශ සංචිත පහත වැටීම සහ විනිමය අනුපාතික මත පීඩනය තීව්‍ර වීමත් හේතුවෙන්, මහ බැංකුව විසින් විනිමය අනුපාතික නිර්ණය කිරීමේදී වැඩි නම්‍යශීලී බවක් පෙන්නුම් කළ අතර, අවසානයේදී 2022 මාර්තු මාසයේදී නිදහස් පාවන විනිමය අනුපාත පද්ධතියකට මාරු කෙරුණි. වෙළඳපොළ සහභාගී වන්නන් විසින් සීමාව ඉක්මවීම හේතුවෙන්, සති කිහිපයක් රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වූ අතර, කෙසේ වෙතත් දැඩි මූල්‍ය ප්‍රතිපත්ති සහ විදේශ විනිමය පිටතට ගලා යාම අවම කිරීම සඳහා වූ අනෙකුත් ක්‍රියා පටිපාටීන් හේතුවෙන් වසරේ අග භාගයේදී රටේ බාහිර අංශය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් විය. මේ තුළින් මූල්‍ය වර්ෂයේ පසු භාගයේදී රුපියල ශක්තිමත් විය.

රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධ ප්‍රයත්නයන්ට සමගාමීව, රජය විසින් විවිධ ආදායම් සංචලනා මිනුම්කරණ ප්‍රකාශයට පත් කෙරුණි. මේ සඳහා සම්මත ආයතනික ආදායම් බදු අනුපාත වැඩි කිරීම, නිශ්චිත සහනයන් ඉවත් කිරීම, ආන්තික පෞද්ගලික ආදායම් බදු අනුපාත ඉහළ නැංවීම සහ එකතු කළ අගය මත බදු (වැට්) ප්‍රමිතිය ඉහළ නැංවීම ඇතුළත් විය. අපි දිගු කාලීන සාර්ව ආර්ථික ස්ථාවරත්වය ළඟා කර ගැනීම උදෙසා රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණය වැදගත් කොට සලකන්නා සේම, අපනයනය පදනම් කරගත් ව්‍යාපාර කෙරෙහි පවතින අහිතකර බලපෑම් සලකා බැලීමට රජයෙන් ඉල්ලා සිටින්නෙමු. 30% ක නව බදු අනුපාතය හේතුවෙන් මෙම ව්‍යාපාර නැවත

# සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය

ආයෝජනය කිරීමේදී සැලකිය යුතු සීමාවන්ට මුහුණ දීමට ඉඩ ඇත. එමඟින් ගෝලීය වෙළඳපොළ තුළ අපගේ තරඟකාරීත්වය අඩු විය හැකි අතර, රටට අවශ්‍ය විදේශ විනිමය ඉපැයීමේ හැකියාවන් කෙරෙහි බලපෑම ඇති වනු ඇත.

### 2022/23 වර්ෂය තුළ අපගේ මූල්‍ය කාර්යසාධනය

පසුගිය වසර තුන පුරාවට ශ්‍රී ලංකාවේ ව්‍යාපාර මුහුණ දුන් නිරන්තර අභියෝග හේතුවෙන් සමූහය විසින් දරා ගැනීමේ හැකියාව ගොඩනැගීම අරමුණු කොට ගෙන ව්‍යාපාරයන්හි වෙනස්කම් සිදු කිරීමත්, කාර්යක්ෂම කරලීමත් සිදු විය. සමූහය තුළ දැඩි ලෙස අනුගමනය කරනු ලබන 'කළ හැකියි' යන ආකල්පය හේතුවෙන්, සියලුම ප්‍රදේශ පුරා මෙහෙයුම් අඛණ්ඩතාවය පවත්වා ගැනීම, තොග චක්‍ර ඵලදායීව සැලසුම් කිරීම, පාරිභෝගික විශ්වාසය තහවුරු කිරීම සහ ද්‍රවශීලීතාවය පාලනය සඳහා අපගේ කණ්ඩායම විසින් උපායමාර්ගික පෙර දැක්මක් සහිතව කටයුතු කළ අතර, කාර්යක්ෂම සම්පාදනයන් සිදු කරන ලදී.

ප්‍රවාහනය සහ සැපයුම්, රෙදිපිළි, පිරිපහදුව සහ අත් ආවරණ සැකසුම් අංශ ඇතුළුව අපනයන මුල් කරගත් අංශවල හිතකර වර්ධනය හේතුවෙන් වාර්ෂික වර්ධනය 44% ක් පෙන්නුම් කරමින්, සමූහය විසින් එහි ඉහළම පිරිවැටුම ලෙස රුපියල් බිලියන 487.43 ක් අත් කර ගනු ලැබිණි.

ප්‍රවාහනය සහ සැපයුම්, පිරිපහදුව, කෘෂිකර්ම සහ වැවිලි අංශවල ප්‍රධානත්වයෙන් වර්ෂය තුළදී සමූහයේ පොලී, බදු, ක්ෂයවීම් සහ ක්ෂයවීම්වලට පෙර ඉපැයීම් (EBITDA) සහ සමූහයේ බදු පොලීවලට පෙර ඉපැයීම් (EBIT) සඳහා මෙවර ඉහළම අගයන් වාර්තා වූ අතර, ඒවා පිළිවෙළින් රුපියල් බිලියන 71.08 සහ රුපියල් බිලියන 61.07 ක් විය. එනම් 69% සහ 82% ක වර්ධනයන් වේ. කාර්යසාධනය, හිතකර විනිමය අනුපාත ගතිකත්වයන් සහ වර්ධනය වන ව්‍යාපාරික කටයුතු මත රඳා පැවතුණි. මූල්‍ය ආදායම රුපියල් බිලියන 20.72 ලෙස 23% කින් ඉහළ ගිය අතර, පැවති ඉහළ පොලී අනුපාත තත්ත්වය හමුවේ මූල්‍ය පිරිවැය රුපියල් බිලියන 39.54 දක්වා දෙගුණයකට වඩා වැඩි විය.

වර්ෂය තුළදී සමූහය විසින් ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් මෙහෙයුම් ඉතිහාසයේ ඉහළම බදුවලට පෙර ලාභයක් (PBT) වාර්තා කරන ලදී. මූල්‍ය කාර්යසාධනය සඳහා අපගේ ප්‍රධාන මිනුම් දණ්ඩ වන බදු පෙර ලාභය රුපියල් බිලියන 42.75 ක් දක්වා 20% කින් වර්ධනය විය. ඒ සඳහා ප්‍රවාහනය සහ සැපයුම්, පිරිපහදුව, වැවිලි, කෘෂිකර්ම සහ අත් ආවරණ සැකසුම් යන අංශයන් මඟින් සපයන ලද ඉහළ දායකත්වය හේතු විය. පැවති බොහෝමයක් දුෂ්කරතා මධ්‍යයේ වුවද, බාහිර වෙනස්වීම් ඵලදායී ලෙස පවත්වා ගෙන යාමට ඇති හැකියාව සහතික කරමින් අංශ දොළොසෙන්, අංශ අටක් විසින්ම වසර තුළදී බදුවලට පෙර ලාභයේ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

වර්ෂය තුළදී 21% සිට 36% දක්වා සමූහයේ සඵල බදු අනුපාතිකයේ වැඩිවීම හේතුවෙන් ඇති වූ බදු අනුපාතවල පුළුල් පදනම් වර්ධනය සමඟ සමූහයේ බදු වියදම් රුපියල් බිලියන 15.08 ලෙස 98% කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළදී සමූහයේ බදු පසු ලාභය, රුපියල් බිලියන 27.67 ක් ලෙස 2% ක අඩුවීමක් වාර්තා විය.

### ශක්තිය සහ ස්ථාවරත්වය

දේපළ, පිරියත සහ උපකරණ පුළුල් කිරීම හේතුවෙන් සමූහයේ මුළු වත්කම් රුපියල් බිලියන 412.74 ක් ලෙස 2% කින් වර්ධනය විය. මීන් අත් ආරක්ෂණ අංශයේ නව ක්‍රීඩා අත්වැසුම් නිෂ්පාදන පහසුකම, රෙදිපිළි අංශයේ යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම් සහ බහු-පරිශීලක බෙදාහැරීමේ මධ්‍යස්ථානයක ප්‍රවාහන සහ සැපයුම් අංශයේ ආයෝජනය නියෝජනය කරනු ලබයි. වසර තුළදී, හේලීස් සමාගම (හේලීස් ප්ලාන්ටේෂන් සර්විසස් පුද්. සමාගම හරහා) විසින් හොරණ ප්ලාන්ටේෂන් පීඑල්සීහි බහුතර කොටස් හිමිකාරීත්වයද අත් කර ගන්නා ලදී. හොරණ ප්ලාන්ටේෂන් පීඑල්සී යනු මධ්‍යම කඳුකරයේ සහ පහතරට ප්‍රදේශයේ හෙක්ටයාර 6,519 කට ආසන්න, වතු 14 ක් පුරා විවිධ භෝග වගාවන් සිදු කරනු ලබන ප්‍රමුඛ පෙළේ ප්‍රාදේශීය වැවිලි සමාගමකි. මෙම සමස්ත අත් කර ගැනීමෙන් ඇතිවන හවුල්කාරීත්වය මඟින් රටේ වැවිලි ක්ෂේත්‍රය තුළ සමූහයේ නියෝජනය තවදුරටත් ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පැවති අනපේක්ෂිතතා හමුවේ සමූහය විසින් ධාරිතාව පුළුල් කිරීම, නිෂ්පාදන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ නිෂ්පාදන ශක්‍යතාවයන් වර්ධනය කරලීම සඳහා අඛණ්ඩ ආයෝජන සිදු කෙරිණි. එමඟින් රටේ ආර්ථික ප්‍රතිසාදනය සහ වටිනාකම් එක් කිරීම සඳහා දීර්ඝ කාලීනව පවතින අවස්ථාවන් කෙරෙහි වන ධනාත්මකභාවය පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම මෙම ආයෝජන තුළින් විදේශ විනිමය උත්පාදනයට සමූහය සතු හැකියාවන් ශක්තිමත් කර ඇත. ඉන් තවදුරටත් ඉපැයුම් අංශය විවිධාංගීකරණය කොට දක්වන අතර, විනිමය අනුපාතිකයේ වෙනස්වීමට ඔරොත්තු දීම ශක්තිමත් කරනු ලබයි. එමෙන්ම සැපයුම්දාමයේ අක්‍රමවත්භාවය සහ ප්‍රවාහනය සීමා වීම හේතුවෙන් අමුද්‍රව්‍ය තොග සහ නිමි භාණ්ඩ ප්‍රමාණය වැඩි කිරීමට සමූහයට සිදු වූ බැවින් වර්ෂය තුළදී තොග 6% කින් වර්ධනය විය.

ස්ථිර ලාභ උත්පාදනය සහ රඳවා ගැනීම හේතුවෙන්, වර්ෂය තුළදී රුපියල් බිලියන 122.71 ක් දක්වා 17% කින් සමස්ත හිමිකම් වර්ධනය විය. වර්ෂය තුළදී, රුපියල් බිලියන 171.93 ක සිට රුපියල් බිලියන 159.70 ක් දක්වා අඩු වූ පොලී දරන ණය ගැනීම්වල ක්‍රමික අඩු වීම මඟින් සමූහයේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් විය. ඒ අනුව සමූහයේ හිමිකම් අනුපාතයේ ණය 1.63 වරක සිට 1.30 වරක් දක්වා අඩු විය. සමූහයේ මූල්‍ය අංශයේ කාර්යසාධනය හරහා, වැඩිකළ ඉපැයීම් විවිධාංගීකරණය කිරීම, කාරක ප්‍රාග්ධන චක්‍ර ප්‍රශස්ත කිරීම සහ පොලී සහ විනිමය අනුපාතවල උච්චාවචනයන්ට නිරාවරණය වීම අවම කිරීම සඳහා ණය අංශය යථා තත්ත්වයට පත් කිරීම තුළින් ව්‍යාපාර ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මෑත වසරවලදී යොදා ගත් ව්‍යාපාර උපායමාර්ග පිළිබිඹු වේ.

### ආර්ථික වටිනාකම් ප්‍රවාහයන්

වටිනාකම් දාමයන් පුරාවට ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ ප්‍රජාවන් සමඟ පුළුල් සබඳතා පවතින, සමාජ-ආර්ථික වශයෙන් ශ්‍රී ලංකාව තුළ බොහෝ වෙනස්කම් ඇති කරනු ලබන ආයතනයක් වීම ගැන අපි ආඩම්බර වන්නෙමු. අප විසින් නිර්මාණය කරන ලද ධනාත්මක සමාජ ආර්ථික බලපෑම්වලින් අතිමහත් බහුතරයක් සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලිය තුළ වන බවද ඉන් අවධාරණය කෙරේ. නිදසුනක් වශයෙන්, සමූහය වසර තුළ ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමෙන් 5.5% ක් උපයා ඇති අතර එය ඇමරිකානු ඩොලර් මිලියන 650.61 ක විදේශ විනිමය ආදායමක් බවට පරිවර්තනය විය. සමූහය විසින් ශ්‍රී ලංකාව තුළ රුපියල් බිලියන 24.33 ක බදු ගෙවීමක් සිදු කර ඇත. එසේම ශ්‍රී ලංකාවේ සේවකයින් 29,453 දෙනෙකුට රැකියා අවස්ථා සපයා ඇති අතර, ඉන් 57% ක් බස්නාහිර පළාතෙන් පරිබාහිරව ක්‍රියාත්මක වේ. සියලු ව්‍යාපාර ක්‍රමවේදයන් හරහා වටිනාකමක් එක් කිරීම අපගේ ආචාර ධර්මවල කොටසකි. සමූහය විසින් විවිධ ව්‍යාපාර හරහා 11,000 කට අධික ග්‍රාමීය වගාකරුවන්, සැපයුම්කරුවන් සහ අනෙකුත් ව්‍යාපාරික හවුල්කරුවන් ගෝලීය සැපයුම් දාමයන් වෙත සම්බන්ධ කරයි. දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන ගොවි ව්‍යාප්ති සේවා සහ ව්‍යුහගත පුහුණු වැඩසටහන් හරහා දැනුම සහ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කරමින් ප්‍රධාන කර්මාන්තයන්හි ශක්‍යතාවන් වැඩිදියුණු කිරීම සහ නිපුණතා සංවර්ධනය සඳහාද අපි මූලික වී කටයුතු කරන්නෙමු.

### නම්‍යශීලී සහ වගකීම්සහගත පාලනය

සෙසු කාලයන්වලට වඩා අර්බුදකාරී කාලවලදී යහපත් පාලන ක්‍රමවේදයන් බෙහෙවින් වැදගත් වේ. සැලකිය යුතු අස්ථාවරත්වයක් සහ අවිනිශ්චිතතාවයක් පවතින පසුබිමක, බාහිර බලවේගවල බලපෑම් පාලනය කිරීමට සහ තීරණාත්මක විසඳුම් ගැනීමට කළමනාකරණ කණ්ඩායමට සහය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කළේය. කඩිනම් සහ ඵලදායී තීරණ ගැනීම සඳහා වැදගත් වූ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමූහයේ කළමනාකරණ කමිටුව (GMC) අතර ශක්තිමත් සබඳතා ගොඩනැගීමට අපගේ පාලන රාමුවද සහය විය. කාලෝචිත, පූර්ව විචාරී ප්‍රතිචාර සඳහා මඟ පාදන ලද සමූහයේ කළමනාකරණ කමිටු රැස්වීම් සෑම සතියකම පැවැත්වීමට අමතරව කෙටි දැනුම්දීම්ද සිදු කරන ලදී. අංශ මට්ටමේ විධායක කමිටුවල සිට සමූහයේ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා වූ බහුවිධ සමාලෝචනය ඉහළ මට්ටමේ නිරීක්ෂණ සහ අධීක්ෂණය සඳහා සහය වේ. සමූහයේ

උපායමාර්ගික අභිලාෂයන් සහ අවදානම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණය සැපයීමට අවශ්‍ය පළපුරුද්ද, කුසලතා සහ විවිධ ඉදිරි දර්ශන පෙරදැරි කරගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය නිසි ලෙස ක්‍රියාත්මක වීම පිළිබඳ මම සතුටුදායක වෙමි.

වර්ෂය තුළදී සමූහයේ කළමනාකරණ කමිටුවෙහි විධායක අධ්‍යක්ෂවරුන් සහ සාමාජිකයින් කිහිප දෙනෙකුගෙන් සමන්විත, විශේෂ ESG මෙහෙයුම් කමිටුවක් පිහිටුවිය. සමූහයේ ESG රාමුව, උපායමාර්ගය, ප්‍රතිපත්ති, අවදානම් සහ අවස්ථා සහ බාහිර බැඳීම් පිළිබඳ අධීක්ෂණය කිරීම කමිටුවේ කාර්යභාරය වේ. කමිටුව ESG ප්‍රමුඛතා පිළිබඳ විධිමත් හා වැඩිදුර සාකච්ඡා සිදු කරනු ලබයි. එමඟින් ESG කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය වෙත වඩාත් ඵලදායී සංවාදයකට සහ විධිමත් වාර්තාකරණයක් සඳහා මඟ පාදයි. සමූහය විසින් වසර තුළ සිය අල්ලස් සහ දූෂණ විරෝධී ක්‍රියා පිළිවෙත් ශක්තිමත් කරන ලද අතර, කිසිම අයුරක දූෂණයක් අප නොඉවසන බව ඉන් පැහැදිලිව ප්‍රකාශ කෙරේ. මම අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ එක්ව, දූෂණ අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් සමාගම සතු වන බව සහතික කිරීමට කැපවී කටයුතු කරමි. වසර තුළදී, සමාගම දූෂණ-විරෝධී නීතිරීති ඇතුළුව අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලටද සම්පූර්ණයෙන් අනුකූලව කටයුතු විය.

### පාරිභෝගික කේන්ද්‍රීය නවෝත්පාදනය වේගවත් කිරීම

සමූහය සෑම විටම උපායමාර්ග සඳහා නවෝත්පාදනය මූලික කරගත් වර්ධනය යොදා ගන්නා අතර, ඊට වැදගත් තැනක් ලබා දෙයි. අපගේ ව්‍යාපාර හරහා පාරිභෝගිකයන් කේන්ද්‍ර කරගත් නවෝත්පාදනය ශක්තිමත් කරනු ලබන අතර, එමඟින් වෙනස් වන ඉල්ලුම් විචලනයන්ට ඉහළ මට්ටමකින් අනුවර්තනය වීමේ හැකියාව ඇති කරයි. නිෂ්පාදන සහ ක්‍රියාවලීන් සඳහා අවශ්‍ය බලශක්තිය, ජලය සහ අපද්‍රව්‍ය වැනි ප්‍රධාන සම්පත් ප්‍රශස්ත කිරීම සඳහා අපි නව ක්‍රම ගවේෂණය කර ඇති බැවින් මෑත වසරවලදී, අපගේ නවෝත්පාදන ප්‍රයත්නයන්හි තිරසාරත්වය සඳහා වැදගත් තැනක් හිමි වේ. නිදසුනක් ලෙස, රෙදිපිළි අංශය විසින් අපද්‍රව්‍ය පාදක කරගත් විලාසිතා වැඩසටහනක් වන "Warna by Mahogany" දියත් කරන ලදී. මෙහිදී ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙන් ජනනය කෙරෙන අපද්‍රව්‍ය භාවිතයෙන් සායම් නිස්සාරණය සිදු කරනු ලබයි. ඉදිකිරීම් ද්‍රව්‍ය අංශය විසින් "Ozon" සන්නාමය යටතේ අවම කාබන් ප්‍රමාණයක් ජනනය කරන විශේෂ ඇලුමිනියම් වර්ගයක් නිපදවූ අතර ප්‍රතිචක්‍රීයකරණය කරන ලද ද්‍රව්‍ය යොදා ගැනීම හේතුවෙන් ඒවායින් පාරිසරික පියසටහන සැලකිය යුතු ලෙස අවම මට්ටමක පවතී. පවිත්‍රකරණ අංශයෙහි බලශක්ති ආවයන කාබන් සහ අත් ආවරණ සැකසුම් අංශයෙහි ප්‍රිමියම් ක්‍රීඩා අත්වැසුම් නිෂ්පාදන සාර්ථකත්වයට පත්වූ අනෙකුත් නවෝත්පාදන අතරට ඇතුළත් වේ.

### පාරිසරික, සමාජීය සහ පාලන රාමුව ස්ථාපනය: ක්‍රියාත්මක කිරීම උදෙසා වන අරමුණ

ජෛව විවිධත්වයට හානි වීම, දේශගුණික විපර්යාස සහ සම්පත් ක්ෂය වීමේ සිට ඉහළ යන ආදායම් අසමානතාවය දක්වා ගෝලීය පාරිසරික, සමාජීය සහ සදාචාරාත්මක අභියෝගවල ශීඝ්‍රතාව, විශාලත්වය සහ තීව්‍රවීම ව්‍යාපාර පාර්ශ්වකරුවන්ගේ වැඩි අවධානයට ලක්වීමට හේතු වී තිබේ. අපගේ නිෂ්පාදන කාණ්ඩ කිහිපයක් සඳහා තිරසාරත්වයේ ප්‍රමුඛයෙකු ලෙස, තිරසාරත්වය යනු කළ යුතු නිවැරදි දෙය පමණක් නොව ව්‍යාපාරයට යහපතක් උදා කරන්නක් ලෙස අපි දැඩි ලෙස විශ්වාස කරන්නෙමු. 2022 වර්ෂයේදී අපි "Hayleys Lifecode" දියත් කිරීමත් සමඟ මේ වෙනුවෙන් කැපවී කටයුතු කළෙමු. එය අපගේ උපායමාර්ගය, අවදානම් කළමනාකරණය සහ තීරණ ගැනීම සඳහා පාරිසරික, සමාජීය සහ පාලන ක්‍රමවේදය සලකා බැලීම් ඒකාබද්ධ කිරීමට ශක්තිමත් ක්‍රමවේදයක් සපයන පරිපූර්ණ පාරිසරික, සමාජීය සහ පාලන සැලසුමක් වේ. 2030 වර්ෂය වන විට හරිතාගාර වායු 1 සහ 2 පරාසයන්හි විමෝචනය 30% කින් අඩු කිරීමට සමූහය උත්සහ කරනු ලබයි. මෙය, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත මාරු වීම, ෆොසිල ඉන්ධන මත පදනම් වූ බලශක්ති ප්‍රභවයන් මත යැපීම අවම කිරීම සහ අනෙකුත් කාබන්හරණ ක්‍රමවේදයන් තුළින් අප මෙහෙයුම් ක්‍රියාවලීන්හිදී අත්කර ගැනීමට අපේක්ෂිත ඉලක්කයකි. අපගේ බලශක්ති අවශ්‍යතාවයෙන් 67% ක් පුනර්ජනනීය ප්‍රභවයන් හරහා සපුරාලීමත් සමඟ, වර්ෂය තුළ සමූහයේ කාබන් පියසටහන 9% කින් අඩු වී ඇති බව මා සතුටින් දන්වා සිටිමි. නිෂ්පාදනයේ චක්‍රය පුරා ස්වභාවික සම්පත් භාවිතය මෙන්ම අපද්‍රව්‍ය සහ දූෂක විමෝචනය අවම කරන තිරසාර සැලසුමක් තුළින් නිෂ්පාදනවල පාරිසරික බලපෑම් අවම කිරීමටද අපි උත්සාහ කරන්නෙමු. එක්සත් ජාතීන්ගේ ගෝලීය සංයුක්තයට (UNGC) සහභාගිවන්නෙකු ලෙස, හේලීස් පීඑල්සී සමාග මද UNGC හි මූලධර්ම දහය අනුගමනය කරනු ලබයි. 2008 වසරේ සිට හේලීස් සමාගම ඕහඩ්ක හි CEO Water Mandate තනතුර දරනු ලබයි. සමූහයේ අනෙකුත් පාරිසරික, සමාජීය සහ පාලන ඉලක්කයන්හි ලබා ඇති ප්‍රගතිය පිළිබඳ මෙම වාර්තාවේ 120 පිටුවේ දක්වා ඇත.

### ජීවිත සමෘද්ධිමත් කිරීම, ජීවනෝපායන් ආරක්ෂා කිරීම

සමාජ යහපත සඳහා ශක්තියක් වීමට අප සතු අධිෂ්ඨානය අපගේ උපායමාර්ගයට අත්‍යවශ්‍ය සාධකයක් වන අතර මෙහෙයුම් ක්‍රියාවලිය තුළින් එය ආරම්භ වේ. රටේ ආර්ථික අර්බුදය, උද්ධමනය සහ සමාජ නොසන්සුන්තාවය ඉහළ යාම හේතුවෙන් අපගේ සේවකයින්ට දෛනික අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ අතර, මූල්‍ය හා මානසික ආතතියට එය නිතැතින්ම හේතු විය. මෙකී වාතාවරණය තුළ, අපගේ සියලුම අංශ ජනතාව ආරක්ෂා කිරීම, වැටුප් සඳහා වෙළඳපළ ගැලපීම් සහ විශේෂ සහන දීමනා හරහා මූල්‍ය යහපැවැත්මට සහය වීම සඳහා ක්‍රියාමාර්ග මාලාවක් හඳුන්වාදීම කෙරෙහි උපායමාර්ගික අවධාරණයක් සිදු කොට ඇත. සැපයුම් දාමය බිඳවැටීම් සහ ආහාර උද්ධමනය ඉහළ යාමත් සමඟ රට තුළ ආහාර සඳහා අනාරක්ෂිතභාවය වැඩි වූ අතර, අත්‍යවශ්‍ය ආහාර, එළවළු සහ පලතුරු අඛණ්ඩව සැපයීම සඳහා අවකාශය සැලසීම තුළින් සමූහය සිය සේවකයින්ට රැකවරණය ලබා දෙන බවට සහතික විය. අපි ප්‍රධාන මාර්ග රැසක ප්‍රවාහන පහසුකම්ද යෙදවූ අතර එමඟින් සේවකයින්ට ඉන්ධන පිරිවැය වැඩිවීමෙන් ඇති වූ බලපෑම අවම කරනු ලැබිණි. හැකියාවන් වර්ධනය කර ගැනීම සහ කුසලතා වැඩිදියුණු කර ගැනීම සඳහා වන ක්‍රමවේදයන් වෙනුවෙන් අපි අඛණ්ඩව ආයෝජනය කළෙමු. ඒ තුළින් පවතින අභියෝග මධ්‍යයේ වුවද, අපගේ කණ්ඩායමට අප සමඟ ස්ථිර සහ තෘප්තිමත් වෘත්තීය ජීවිතයක් සහතික කරන ලදී. තීරණ ගැනීමේ කණ්ඩායම්හි විවිධත්වය වැඩි කිරීම කෙරෙහිද අපි අවධානය යොමු කරන්නෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ විධායක සහ කළමනාකරණ කමිටු තුළ පුළුල් කාන්තා නියෝජනයක් පවතී. එමඟින් නායකත්ව භූමිකාව පුළුල් කරමින් ආයතනික ශක්තිය වර්ධනය කරනු ලබයි.

හේලීස් වැනි බහුවිධ සහ පුළුල්ව පැතිරී ඇති සංවිධානයක කාර්යභාරය වනුයේ සහසබැඳියාව සැමවිටම ප්‍රවර්ධනය කිරීම බව මම තරයේ විශ්වාස කරමි. මෙය සාධාරණ ආර්ථික වර්ධනයක් සඳහා මග පාදන අතර, ප්‍රජාවන් අතර බැඳීම් සහ අවබෝධය ශක්තිමත් කරන අතරම සමාජ ස්ථාවරත්වය පෝෂණය කරයි. අපගේ විස්තීර්ණ ග්‍රාමීය වගාකරුවන්ගේ සහ දිවයින පුරා පැතිරී පවතින කුඩා වතු හිමියන්ගේ සැපයුම් ජාලය හරහා අපි ග්‍රාමීය ප්‍රජාවන්ට සහය වන ආර්ථික සවිබල ගැන්වීම් සිදු කරන්නෙමු. සමස්තයක් ලෙස ජාතියටම ප්‍රතිලාභ සැලසෙන ආර්ථික ධනය උත්පාදනය කරමින්, ග්‍රාමීය ගොවියා වෙනුවෙන් ගෝලීය අවස්ථාවන් සලසනු ලබන ව්‍යාපාරයක් වීම පිළිබඳ අපි ආඩම්බර වෙමු.

අපගේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියට පරිබාහිරව, රජයේ සෞඛ්‍ය සේවා අංශයේ ඖෂධ සහ අත්‍යවශ්‍ය පරිභෝජන ද්‍රව්‍යවල බරපතළ හිඟය විසඳීම සඳහා අපගේ අංශ විසින් සම්පත් යෙදවීමත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් සිදු කරන ලදී. අරමුදල් සීමා කිරීම් හේතුවෙන් අඩපණ වූ මහජන සෞඛ්‍ය සේවා අංශයේ අඛණ්ඩ පැවැත්මට සහය වෙමින් රට පුරා පිහිටි රජයේ රෝහල් වෙත මේ හරහා පරිත්‍යාග රැසක් සිදු කරන ලදී (වැඩිදුර තොරතුරු සඳහා 262 පිටුව බලන්න).

### ව්‍යාපාර නිෂ්පාදන කාණ්ඩ පිළිබඳ සමාලෝචනය

අපනයන-අභිමුඛ ව්‍යාපාරවල ශක්තිමත් ක්‍රියාකාරී වර්ධනය සහ සම්පත් වඩා හොඳින් උපයෝජනය කිරීම හේතුවෙන් සමූහයේ ඉපැයීම් වැඩි වශයෙන් අපනයන ආදායම සහ අනෙකුත් විදේශ විනිමය ඉපැයීම්වලින් සමන්විත විය. එය වසර තුළ ලත් පිරිවැටුමෙන් 62% ක් විය. සමූහය විදේශ විනිමය මඟින් ලැබෙන දායකත්වය වැඩි කිරීමට කටයුතු කරන බැවින්, අපනයන-අභිමුඛ අංශවල ධාරිතාව සහ ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා දැනට සිදු

# සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය

කෙරෙමින් පවතින ආයෝජනයන් හරහා සමූහයේ ආයෝජන සැලැස්මෙහි ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබිඹු කෙරේ.

වසර තුළ සමූහයේ පිරිවැටුම ඇමරිකානු ඩොලර් බිලියන 1.35 ක් වූ අතර පොලී සහ බදුවලට පෙර ඉපැයීම් ඇමරිකානු ඩොලර් මිලියන 169.57 දක්වා 6% කින් වැඩි විය. ඩොලර්වලින් දැක්වෙන මූලික ලාභදායිතාවයේ වර්ධනය තුළින් ප්‍රධාන අපනයන-අභිමුඛ අංශවල පරිමාව වර්ධනය පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, සමස්ත ලාභදායිතාවයට ඉහළ මූල්‍ය පිරිවැය සහ බදු වියදම් බලපෑ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, වසර තුළ බදුවලට පෙර ලාභය ඇමරිකානු ඩොලර් 118.69 ක් දක්වා පහත වැටුණි.

සමූහයේ ව්‍යාපාරික අංශවල ක්‍රියාකාරීත්වය පිළිබඳ ඉහළ මට්ටමේ දළ විශ්ලේෂණයක් පහතින් සපයනු ලැබේ. සවිස්තරාත්මක කළඹ සමාලෝචනය 122 පිටුවෙහි දැක්වේ.

**ප්‍රවාහනය සහ සැපයුම්**

රුපියල් බිලියන 15.01 ක බදු ගෙවීමට පෙර ලාභයක් සහිතව සමූහයේ ලාභයෙන් 30% ක ඉහළම දායකත්වයක් දක්වමින් ඇඩ්වාන්ටිස් සමූහය මෙම වසර තුළ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. මෙය පෙර වසරට සාපේක්ෂව 38% ක වර්ධනයකි. වර්ෂය තුළ වාර්තාගත ලාභයක් ලබා දුන් ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන කළමනාකරණය, සමුද්‍ර හා බලශක්ති සහ ගුවන් සේවා යනාදි උප අංශවල ප්‍රබල දායකත්වයෙන් මෙකී කාර්යසාධනය තහවුරු විය.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඒකාබද්ධ ප්‍රවාහන සහ සැපයුම් සේවා සපයන්නා ලෙස, ඇඩ්වාන්ටිස් සමාගම එහි ශක්තිමත් වෙළඳපළ තත්ත්වයන් හරහා අඛණ්ඩව සිය ජාත්‍යන්තර පැවැත්ම වර්ධනය කර ගනිමින්, නව අවස්ථා ග්‍රහණය කර ගනු ලැබිණි. සමස්ත අංශයේ ලාභය සඳහා ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන කළමනාකරණය සහ සමුද්‍ර සහ බලශක්ති යන උප අංශ මඟින් වැඩි දායකත්වයක් සැපයීය. 2022/23 අවසාන භාගය දක්වා අනුපාත ක්‍රමයෙන් පහත වැටුණද, ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන කළමනාකරණ අංශය වසරේ වැඩි කාලයක් සඳහා වෙනස්වන භාණ්ඩ ප්‍රවාහන ගාස්තු මඟින් ප්‍රශංසනීය වර්ධනයක් වාර්තා කළේය. දේශීය වෙළඳපොළට ඉන්ධන බෙදා හැරීම සඳහා කාලෝචිත ප්‍රවේශයක් ලබා ගැනීමට සමුද්‍ර සහ බලශක්ති අංශය උත්සාහ කළ අතර, එය ශක්තිමත් ආදායම් සහ ලාභ වර්ධනයකට හේතු විය. තනි වහලක් සහිතව ඇඩ්වාන්ටිස් ලොජිස්ටික්ස් සිටි හි නිර්මාණය කර ඇති, ජාතියේ විශාලතම බහු-පරිශීලක බෙදාහැරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතුද ඇඩ්වාන්ටිස් සමාගම විසින් සම්පූර්ණ කරන ලදී.

ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් සහ වෙළඳ ප්‍රවාහවල අපේක්ෂිත මන්දගාමිත්වය හේතුවෙන් කෙටි කාලීන පීඩනයන් ඇති වුවද, වරාය යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය පෙළඹවීමක් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් ඇඩ්වාන්ටිස් සමාගම සඳහා වන දිගු කාලීන දැක්ම ධනාත්මක අයුරින් පවතී. ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩ හරහා පාරිභෝගිකයින් ග්‍රහණය කර ගැනීම සඳහා එහි සන්නාමය සතු වන ශක්තිය සහ පුළුල් සබඳතාවන් ප්‍රයෝජනයට ගනිමින් මෙම අංශය වැඩි භූගෝලීය සහ ව්‍යාපාරික විවිධාංගීකරණයක් සිදු කරනු ඇත.

**පවිත්‍රකරණය**

පවිත්‍රකරණ අංශය විසින් ආදායම් සහ බදුවලට පෙර ලාභය සඳහා පිළිවෙළින් 84% ක සහ 78% ක වර්ධනයක් ලබා ගන්නා ලදී. බදුවලට පෙර ලාභය වාර්තා වූයේ රුපියල් බිලියන 8.25 ක් ලෙසය. ඇමරිකා එක්සත් ජනපදයේ අඛණ්ඩ වර්ධනයත්, ඉහළ අගය එකතු කළ නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමත් මඟින් කාර්යසාධනය මෙහෙයවනු ලැබීය. පොල් කටුවලින් සක්‍රියකෘත කාබන් නිපදවනු ලබන, ගෝලීය වශයෙන් ප්‍රමුඛ පෙළේ නිෂ්පාදකයෙකු ලෙසද මෙම අංශය සිය වෙළඳපළ තත්ත්වය පවත්වා ගෙන ගියේය.

ඵලදායි ලෙස සැලසුම් කිරීම සහ අමුද්‍රව්‍ය තොග සහ ඉන්ධන තොග කාලෝචිත ලෙස ප්‍රසම්පාදනය කිරීම හේතුවෙන් සැපයුම් දාමයන්හි බිඳ වැටීම් සහ ප්‍රවාහන බාධක මැඩපැවැත්වීමට අංශයට හැකි විය. මේ හේතුවෙන් බාධාවකින් තොරව මෙහෙයුම් සිදු විය. සැපයුම්කරුවන් සමඟ විස්තීර්ණ සබඳතා පවත්වා ගැනීමෙන් වසර තුළ පැවති බාධා කිරීම් නොතකා, අඛණ්ඩව අමුද්‍රව්‍ය සපයා ගැනීමට අවස්ථාව උදාවිය. අගය එකතු කළ බලශක්ති ආචනය කාබන් සහ ඉහළම ශ්‍රේණියේ නිෂ්පාදන සංවර්ධනය කිරීමේදී අංශය අඛණ්ඩව ප්‍රගතියක් ලබා ඇති අතර එය පරිපූර්ණ නිෂ්පාදන සංයුතියක් සම්පාදනය කිරීම සඳහා සහය විය.

වාතය සහ ජලය පිරිපහදු කිරීමේ ක්‍රමවේදයන් හි අවශ්‍යතාව සහ දැඩි පාරිසරික රෙගුලාසි හේතුවෙන් ගෝලීය වශයෙන් සක්‍රියකෘත කාබන් සඳහා ඉල්ලුම වැඩි වූ බැවින් මෙම අංශය සඳහා ධනාත්මක පරිසරයක් නිර්මාණය වී තිබේ. හේකාබ් සමාගම විසින් පුද්ගල සහ නායකත්ව සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින්, නවෝත්පාදන ක්‍රමවේද සහ නිෂ්පාදන හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා මෑතකාලීනව ආයෝජන සිදු කරනු ලැබිණි. එමඟින් අගය එකතු කළ නිෂ්පාදන සඳහා වැඩිවන ඉල්ලුමෙන් ප්‍රයෝජන ගැනීමට හැකි වනු ඇත.

**වැවිලි**

සමූහයේ කලාපීය වැවිලි සමාගම් (RPCs), තලවකැලේ ටී එස්ටේට්ස් පීඑල්සී සමාගම සහ කැලණිවැලි ප්ලාන්ටේෂන් පීඑල්සී සමාගම විසින් තේ වෙන්දේසිවලදී ප්‍රමුඛතම මිල ගණන් ලබන්නන් ලෙස පිළිගැනීමක් පවත්වා ගනිමින්, තේ කර්මාන්තයේ වඩාත්ම ලාභදායී සහ ගුණාත්මකභාවය කේන්ද්‍ර කරගත් සමාගම් ලෙස කටයුතු කරනු ලබයි. කෘෂි රසායනික ද්‍රව්‍ය තහනම් කිරීම හේතුවෙන් ඇති වූ දිගු කාලීන බලපෑම්, යෙදවුම් මිල ඉහළ යාම සහ ඉන්ධන

**කොහු ආශ්‍රිත නිෂ්පාදන**

**උපාය මාර්ගික අවධාරණය**

නව වෙළඳපොළ තුළ පාරිභෝගික අත්කර ගැනීම

ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවයි

ප්‍රතිවර්තී අනුකලනය

| | |
|---|---|
| පිරිවැටුම | +37% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +238% |
| බදුවලට පෙර ලාභය | +50% |
| මුළු වත්කම් | +7% |
| ආර්ථික අගය නිර්මාණය | +96% |
| කාබන් පියසටහන | +6% |

**අත් ආරක්ෂාව**

**උපාය මාර්ගික අවධාරණය**

අගය එකතු කළ නිෂ්පාදන වෙත යොමු වීම

කාර්යක්ෂමතාවය සහ පිරිවැය කළමනාකරණ මූලපිරීම්

ESG ස්ථාපනය

| | |
|---|---|
| පිරිවැටුම | +36% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +41% |
| බදුවලට පෙර ලාභය | +5% |
| මුළු වත්කම් | -1% |
| ආර්ථික අගය නිර්මාණය | +22% |
| කාබන් පියසටහන | -9% |

**පවිත්‍රකරණය**

**උපාය මාර්ගික අවධාරණය**

අගය එකතු කළ නිෂ්පාදන නව්‍යකරණය

කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව

සැපයුම් දාම කාර්යක්ෂමතාව

| | |
|---|---|
| පිරිවැටුම | +84% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +169% |
| බදුවලට පෙර ලාභය | +78% |
| මුළු වත්කම් | +1% |
| ආර්ථික අගය නිර්මාණය | +90% |
| කාබන් පියසටහන | -1% |

**රෙදිපිළි**

**උපාය මාර්ගික අවධාරණය**

සන්නාමය පදනම් කරගත් උපායමාර්ගය

තිරසාරත්වය යොදා ගැනීම

INNO නිෂ්පාදන කළඹ පුළුල් කිරීම

| | |
|---|---|
| පිරිවැටුම | +90% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +135% |
| බදුවලට පෙර ලාභය | -5% |
| මුළු වත්කම් | +9% |
| ආර්ථික අගය නිර්මාණය | +22% |
| කාබන් පියසටහන | -5% |

හිඟය වැනි බාධා පැවතියද, මෙම අංශය නොසැලී සිටිමින් ආදායම සහ බදු පෙර ලාභය පිළිවෙළින් 65% ක් සහ 136% ක් ලෙස දක්වන ලදී.

අංශයේ ලාභදායිත්වය සඳහා ඉහළ යන ලද තේ මිල හේතු විය. ලාභදායිත්වය සහ ගුණාත්මකභාවය ඇති කරලීමට ඵලදායිතා වැඩිදියුණු කිරීම් හරහා ආදායම් උපරිම කිරීම සහ කෘෂිකාර්මික යෙදවුම් ප්‍රශස්ත කිරීම සඳහා නිරවද්‍ය කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම යොදා ගැනීම කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කරන ලදී. මෙහෙයුම් පරිසරයේ අභියෝග උත්සන්න වීමත් සමඟම, ඉන්ධන සහ යෙදවුම් ද්‍රව්‍ය තොග වැඩි කිරීමට අංශය විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබිණි. එමඟින් සියලු වතුවල මෙහෙයුම් බාධාවකින් තොරව පවත්වා ගැනීමට හැකි විය. කම්කරුවන් සහ වතු ප්‍රජාවන් ආරක්ෂා කිරීම සඳහා ගත් සහන ක්‍රියාමාර්ගවලට අමතරව, අංශය මඟින් සිය වැටුප් නොවන ආදායම් කොටස් ආකෘතිය පුළුල් කරන ලදී. එමෙන්ම වතු කම්කරුවන් සඳහා අතිරේක ආදායම් මාර්ගයක් ලබා දුන් වල් නෙළීමේ කටයුතු සඳහා මිනිස් ශ්‍රමය යොදා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. තොග තේ කෙරෙහි අවධානය යොමු කිරීම සහ ඉහළ ආන්තික වෙළඳපොළවල් වෙත ප්‍රවේශය වැඩි වීම හේතුවෙන් Mabroc Teas මඟින්ද ඉහළ වර්ධනයක් වාර්තා කරනු ලැබිණි. කෙසේ වෙතත්, මූල්‍ය වර්ෂයේ අවසාන භාගයේදී, ලාභදායිත්වය සඳහා ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ඉහළ යාම සහ දැඩි මිල තරඟකාරීත්වය බලපාන ලදී.

ප්‍රධාන තේ මිලදී ගැනීමේ වෙළඳපොළවල පවතින අවිනිශ්චිතතා සහ භූ දේශපාලනික බලපෑම් ඉල්ලුමේ ගතිකත්වයට බලපෑමක් විය හැකි වුවද, 2023 වර්ෂයේදී රටේ තේ නිෂ්පාදනය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය වෙළෙඳපොළ සඳහා රටේ තරඟකාරිත්වයට බලපෑම් ඇති කළ හැකි, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම දැඩි අභියෝග යක් වේ. මෙම පසුබිම තුළ වුවද, සමූහයේ වැවිලි අංශය විසින් තිරසාර විසඳුම් ගවේෂණය කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත. එමඟින් මෙම තීරණාත්මක කර්මාන්තයේ දිගු කාලීන පැවැත්මට හේතු වන එහි ස්ථිරසාර සන්නාමය තහවුරු කිරීම, තිරසාර ක්‍රියාමාර්ගයන් සහ ගුණාත්මක ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම සිදු කරනු ඇත. අපි මෙම අංශය තුළ දිගු කාලීන ප්‍රතිලාභ ලබා දෙන ආයෝජන සිදු කර ඇත. ගෝලීය තේ වෙළඳපොළේ තරඟකාරී පැවැත්මක් සඳහා අවැසි නිෂ්පාදන ධාරිතාව පවත්වා ගැනීම සහ පුළුල් කිරීමට අඛණ්ඩ ආයෝජන සහතික කරමින්, කලාපීය වැවිලි සමාගම් සඳහා ලබා දී ඇති කල්බදු කාලසීමාව රජය විසින් දීර්ඝ කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

### අත් ආරක්ෂාව

ගෝලීය වශයෙන් ඉල්ලුම අඩු වුවද, අත් ආරක්ෂණ අංශය විසින් වසර තුළදී 36% ක ආදායම් වර්ධනයක් ලබා ගන්නා ලදී. එමඟින් උසස් අගය එකතු කළ නිෂ්පාදන ඉහළ නැංවීමට ගත් උපායමාර්ගික ප්‍රයත්නයන් පිළිබිඹු කරයි. අත් ආරක්ෂණ අංශය විසින් ලාභදායිත්වයට හේතු වන ක්‍රියාවලීන් කාර්යක්ෂම කිරීම සහ පිරිවැය කළමනාකරණය කෙරෙහිද අඛණ්ඩව අවධානය යොමු කරන ලදී. බදු පෙර ලාභය රුපියල් බිලියන 5.25 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 5% ක වර්ධනයකි. පසුගිය වසර දෙක තුළ ඉල්ලුමේ මන්දගාමිත්වය සහ මිල ක්‍රමයෙන් පහත වැටීම හේතුවෙන් බලපෑමට ලක් වූ අංශයේ යුරෝපීය මෙහෙයුම්හි සෘණාත්මක ඉපැයීම්, ලාභදායිත්වයේ නිශ්චල වර්ධනය මඟින් පෙන්නුම් කරයි.

ඇමරිකානු පාපන්දු, පාපැදි, යෝගා සහ අසුන් පැදීම වැනි විවිධ යෙදුම් සඳහා පහසුකම් සපයන 'DPL Sports' ආරම්භ කිරීම ප්‍රධාන සන්ධිස්ථානයකි. එමඟින් උසස් ප්‍රමිතියකින් යුතු ක්‍රීඩා අත්වැසුම් නිෂ්පාදන හඳුන්වා දෙන ලදී. ජූලි මාසයේ යුරෝපයේදී ආරම්භ කරන ලද, නව නිෂ්පාදන පරාසය සඳහා ආරම්භක ප්‍රතිචාරය ඉතා යහපත් වේ. මෙම නව නිෂ්පාදන යෝජනාව මඟින් අවස්ථා රැසක් නිර්මාණය කරනු ඇත. ප්‍රංශයේ වෙළඳ සමාගමක් අත්පත් කර ගැනීමෙන් පසු, වසර තුළදී DPL France පිහිටුවන ලදී. එමඟින් අංශය මඟින් යුරෝපය තුළ එහි ව්‍යාපාර පුළුල් කරන ලදී. මෙම අත්පත් කර ගැනීමත් සමඟ අංශය විසින් පෝලන්තයේද පිහිටුවීමක් සිදු කරන ලදී. අපගේ යුරෝපීය සාමාජිකයා වන ICOGUANTI S.p.A හි අනුබද්ධිත ආයතන ලෙස එය මේ වනවිට ක්‍රියාත්මක වේ.

ආර්ථික ක්‍රියාකාරකම්වල ගෝලීය පසුබෑස්ම හේතුවෙන්, ගෝලීය වශයෙන් අත්වැසුම් සඳහා පවතින ඉල්ලුම කෙටි කාලීනව අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂිත අත්වැසුම් නිෂ්පාදන, ප්‍රධාන වෙළඳපළවල් යථාතත්ත්වයට පත් වීමෙන් ඇතිවන අවස්ථා ග්‍රහණය කර ගැනීම සඳහා හේතු වී තිබේ. මෙම විශේෂිත අත්වැසුම් නිෂ්පාදන මඟින් මධ්‍ය කාලීන - දිගු කාලීන වශයෙන් නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීම සහ අගය එකතු කිරීම සිදු කරනු ලබයි.

### කෘෂිකර්මාන්තය

කෘෂිකාර්මික අංශය විසින් ආදායම සහ බදු ගෙවීමට පෙර ලාභය පිළිවෙළින් 37% සහ 118% ක්; බදු පෙර ලාභය රුපියල් බිලියන 5.01 ක් වාර්තා කරමින් සුවිශේෂී වර්ධනයක් සහිත වසරක් සනිටුහන් කරන ලදී. සැලකිය යුතු අස්ථාවරතා මධ්‍යයේ වුවද, තොග කළමනාකරණය, බෙදා හැරීම සැලසුම්කරණය සහ නිෂ්පාදන හැකියාවන් ශක්තිමත් කිරීම පිළිබඳ අංශයේ උපායමාර්ගික ඉදිරි දැක්ම මඟින් අභියෝගවලට මුහුණ දීමේ හැකියාව ඇති කරන ලදී. කර්මාන්තයේ ගතිකත්වය සහ වෙනස්වන ඉල්ලුම් තත්වයන් හමුවේ වූවද, අංශය විසින් සිය වෙළඳ නාමවල ස්ථිරභාවය පවත්වා ගෙන ගිය අතර, ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ බලාපොරොත්තු සහ විශ්වසනීයත්වයද තහවුරු කරන ලදී.

#### ඉදිකිරීම් ද්‍රව්‍ය

**උපාය මාර්ගික අවධාරණය**

- අපනයන වෙළඳපොළ වර්ධනය
- නිෂ්පාදන නවෝත්පාදනය
- කාර්යක්ෂමතාව සහ පිරිවැය කළමනාකරණය

| | |
|---|---|
| පිරිවැටුම | +6% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | -18% |
| බදුවලට පෙර ලාභය | -89% |
| මුළු වත්කම් | -13% |
| ආර්ථික අගය නිර්මාණය | +37% |
| කාබන් පියසටහන | -30% |

#### වැවිලි

**උපාය මාර්ගික අවධාරණය**

- සම්පත් ප්‍රශස්තකරණය
- පුනර්ජනනීය කෘෂිකර්මය
- ගුණාත්මකභාවය සඳහා කැපවීම

| | |
|---|---|
| පිරිවැටුම | +65% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +125% |
| බදුවලට පෙර ලාභය | +136% |
| මුළු වත්කම් | +57% |
| ආර්ථික අගය නිර්මාණය | +47% |
| කාබන් පියසටහන | -4% |

#### කෘෂිකර්මාන්තය

**උපාය මාර්ගික අවධාරණය**

- ඵලදායී කාර්ය ප්‍රාග්ධන කළමනාකරණය
- නාවෝත්පාදනය
- මූලික සම්බන්ධතා කළමනාකරණය

| | |
|---|---|
| පිරිවැටුම | +37% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +145% |
| බදුවලට පෙර ලාභය | +118% |
| මුළු වත්කම් | +2% |
| ආර්ථික අගය නිර්මාණය | +60% |
| කාබන් පියසටහන | -2% |

#### පාරිභෝගික සහ විකුණුම්

**උපාය මාර්ගික අවධාරණය**

- පූර්ව විචාර් භාණ්ඩ තොග කළමනාකරණය
- පාරිභෝගික කේන්ද්‍රීබව
- නිෂ්පාදන සහ සැපයුම් දාම විශිෂ්ටත්වය

| | |
|---|---|
| පිරිවැටුම | -24% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | -12% |
| බදුවලට පෙර ලාභය | -88% |
| මුළු වත්කම් | -11% |
| ආර්ථික අගය නිර්මාණය | -5% |
| කාබන් පියසටහන | -4% |

# සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය

පොහොර නිෂ්පාදන කාණ්ඩය විසින්ද කාර්යසාධනය තහවුරු කරන ලදී. එමඟින් තොග අඛණ්ඩව ලබා ගැනීම සහතික කිරීම සඳහා එහි කාරක ප්‍රාග්ධන චක්‍ර ඵලදායි ලෙස කළමනාකරණය කරනු ලැබිණි. භෝග රැකවරණ කාණ්ඩය විසින් නව සහල් පළිබෝධනාශක දෙකක් හඳුන්වාදීම හේතුවෙන්, එම කාණ්ඩය ඉපැයීම් සඳහා ප්‍රධාන දායකත්වයක් ලබා දුණි. මෙම අංශය කාර්යක්ෂම බෙදාහැරීම් ක්‍රමවේදයන් තුළින් අඛණ්ඩ නිෂ්පාදන සැපයුම ඔස්සේ තරඟකාරී බංගලාදේශ වෙළඳපොළ තුළ එහි ස්ථාවරය තවදුරටත් තහවුරු කරන ලදී. අපනයනවලදී, වැඩි දියුණු කළ නිෂ්පාදන යෝජනා සහ නව පාරිභෝගික අත්පත් කර ගැනීම් මඟින් කෘෂිකර්මය සහ ආහාර යන දෙඅංශයෙන්ම වර්ධනයක් වාර්තා කරන ලදී.

විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු කිරීම, ගෝලීය භාණ්ඩ මිල ක්‍රමයෙන් සංකෝචනය සහ පොලී අනුපාත සංකෝචනය හේතුවෙන් රටේ කෘෂිකර්ම අංශය යථා තත්ත්වයට පත් වීම අපේක්ෂා කරනු ලබයි. අපගේ නිෂ්පාදන කාණ්ඩ තවදුරටත් විවිධාංගීකරණය කිරීමට උත්සාහ කරන්නාසේම, අපගේ අපනයන ව්‍යාපාරයේ ඉහළ විනිවිදභාවයක් ඇති කරමින්, හේලීස් කෘෂිකාර්මික අංශය මඟින් ආර්ථිකය සවිබල ගැන්වීමට සහ කර්මාන්තයේ දිගු කාලීන තිරසාරභාවයට මඟපාදමින් වගාකරුවන් සහ හවුල්කරුවන්ගේ ජාලය සමඟ නිරන්තරයෙන් කටයුතු කරනු ඇත.

### රෙදිපිළි

සන්නාම කේන්ද්‍ර කරගත් උපායමාර්ගය හේතුවෙන් වසර තුළදී රෙදිපිළි අංශය විසින් ඉහළ ලාභාංශ ගෙවා ඇති අතර හිතකර ඉල්ලුම පාදක කොට ගෙන ආදායම රුපියල් බිලියන 60.01 දක්වා 90% කින් වර්ධනය විය. මූලික ලාභදායිත්වය, අනර්ඝ නිෂ්පාදන එකතුවක් සහ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාවය කෙරෙහි නිරන්තරයෙන් අවධානය යොමු කිරීම මඟින් තහවුරු විය. එමඟින් අංශයට එහි මෙහෙයුම් ලාභ ආන්තිකය පුළුල් කිරීමට හැකි විය. එය වර්ෂය තුළ බලශක්ති සහ යෙදවුම් පිරිවැයේ ශීඝ්‍ර වර්ධනය හේතුවෙන් ඇති වූ සුවිශේෂී ජයග්‍රහණයකි. කෙසේවෙතත්, වසර තුළ පොලී අනුපාතවල තියුණු වැඩිවීම මෙන්ම වසර තුළදී 5% කින් බදු පෙර ලාභය පහළ වැටීමට හේතු වූ පෙර වසරේ විදේශ විනිමය ලාභ සාමාන්‍යකරණය වීම මඟින් බදු පෙර ලාභය බලපෑමට ලක් විය.

රටේ සමාජ-ආර්ථික අභියෝග සහ දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් ජාත්‍යන්තර අවධානය අසතුටුදායක මට්ටමක පැවතුණි. මෙම සෘණාත්මක ආකල්පය පහ කිරීමට මෙන්ම නියමිත වේලාවට බෙදා හැරීම් තහවුරු කිරීම සඳහා ගෝලීය වෙළඳ නාම සමඟ ක්‍රියාශීලී සහ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට අංශයට සිදු විය. අපි නවෝත්පාදනය සඳහා නිරන්තර ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදිමු. කීර්තිමත් සම්මාන මඟින් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්ව ඇති, ස්වාභාවික සායම් සහ වර්ණක පරාසයක් මෙන්ම ප්‍රතිචක්‍රීයකරණය කරන ලද නූල් වර්ග ඇතුළුව විකල්ප නිෂ්පාදන රැසක් ඉදිරිපත් කරමින්, ෂහභඩ සන්නාමයේ විනිවිදභාවය සඳහා අංශය විසින් කටයුතු කරන ලදී.

උද්ධමන පීඩනය සහ ආර්ථික අවිනිශ්චිතතාවය මඟින් ඉල්ලුමේ නොවැළැක්විය හැකි මන්දගාමීත්වයක් ඇති කර ඇති බැවින්, ගෝලීය ඇඟලුම් සහ රෙදිපිළි කර්මාන්තයේ ඉදිරි දැක්ම 2023 වර්ෂයේදීද අභියෝගවලට මුහුණ පානු ඇත. ඊට පිළියම් වශයෙන්, මෙහෙයුම් ආකෘති, සැපයුම් දාම සහ අලෙවිකරණ ප්‍රයත්නයන් යොදා ගනිමින් නිෂ්පාදනය වේගවත් කිරීමට කටයුතු කරනු ඇත. ඇඟළුම් අංශය විසින් මෑත වසරවල අනුගමනය කරන ලද සන්නාමය පදනම් කරගත් උපායමාර්ගය ක්‍රියාත්මක කරනු ඇත. එමෙන්ම වෙනස්වන පාරිභෝගික හැසිරීම්, තිරසාර නිෂ්පාදන හා නිෂ්පාදන සැලසුම් සහ නවෝත්පාදනයන් කෙරෙහිද අවධානය යොමු කරනු ඇත.

### කොහු ආශ්‍රිත නිෂ්පාදන

කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය වර්ෂය තුළ ආදායම සහ බදු පෙර ලාභයේ වර්ධනය පිළිවෙළින් 37% ක සහ 50% ක් ලෙස වාර්තා කරන ලදී. මෙහි කාර්යසාධනය සාම්ප්‍රදායික නොවන වෙළඳපළ වෙත සාර්ථක ලෙස ප්‍රවේශ වීම සහ ක්‍රියාවලි කාර්යක්ෂමතාව පිළිබඳ උපායමාර්ග මත රඳා පැවතුණි. මෙම අංශය විසින් උතුරු අප්‍රිකාව සහ යුරේසියාව වෙත වැඩි ප්‍රවේශ වීමක් සමඟ නව වෙළඳපළ තුළ පාරිභෝගිකයින් අත්පත් කර ගැනීමට ශක්තියක් වූ වෙළඳ ප්‍රදර්ශන සඳහා නිරන්තරයෙන් සහභාගී විය. නිෂ්පාදන සම්බන්ධයෙන් ගත් කළ, පැළ වර්ධනය කරන මාධ්‍ය සහ මෙට්ට යන නිෂ්පාදන ප්‍රශංසනීය වර්ධනයක් වාර්තා කළ අතර, බුරුසු වෙළඳ භාණ්ඩ සහ බිම් ආවරණ ආදී නිෂ්පාදන වෙනස්වන ඉල්ලුම් තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක් විය.

ස්ප්‍රින්ග් මෙට්ට සහ පැළ සිටුවීමට යොදා ගන්නා බෑග් නිෂ්පාදනයේ ධාරිතාව පුළුල් කිරීම සඳහා රුපියල් මිලියන 500 ක ආයෝජනයක් සිදු කරමින් නිෂ්පාදනය තවදුරටත් පුළුල් කරන ලදී. මෙම අංශයද එහි ප්‍රතිවර්තී අනුකලනය පුළුල් කරමින් එහි අමුද්‍රව්‍ය සැපයුම් සහතික කිරීම සිදු කරන ලදී. පැළ වර්ධනය වන මාධ්‍ය, ඛාදනය පාලනය සහ උද්‍යාන විද්‍යාව වැනි නිෂ්පාදන කාණ්ඩ මූලික වූ මෙම අංශයේ ඉල්ලුම සඳහා පවතින දිගු කාලීන ගතිකත්වයන් හිතකර වනු ඇතැයි අපි ශුභවාදී වෙමු. නව නිෂ්පාදන යෙදුම්වල වෙළඳපළ සංවර්ධනය ගවේෂණය කරමින්, මෙම අංශය නූතන වෙළඳපළට තුළ වැඩි ප්‍රවේශයක් නිරන්තරව පවත්වා ගෙන යනු ඇත.

### කාර්මික යෙදවුම්, විදුලිබල සහ බලශක්ති

අභියෝගාත්මක වසරක් තුළ ආදායම සහ බදු පෙර ලාභය පිළිවෙළින් 24% සහ 21% ක් ලබා ගැනීම උදෙසා අංශය විසින් ප්‍රශංසනීය ලෙස කටයුතු කරන ලදී. මෙහි කාර්යසාධනය, කාර්මික අමුද්‍රව්‍ය (IRM), ජීවන විද්‍යාවන් සහ ඉංජිනේරු විද්‍යාවන් ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක මාලදිවයිනේ සහ බංග්ලාදේශයේ

**සංචාරක කටයුතු**

**උපාය මාර්ගික අවධාරණය**

නිෂ්පාදන පිරිනැමීම් ශක්තිමත් කිරීම

මානව සම්පත ප්‍රශස්ත කිරීම

ආදායම විවිධාංගීකරණය

| | |
|---|---|
| පිරිවැටුම | +96% |
| පොලී සහ බදුවලට පෙර ඉපැයීම් | -12% |
| බදුවලට පෙර ලාභය | +43% |
| මුළු වත්කම් | +4% |
| ආර්ථික අගය නිර්මාණය | -1% |
| කාබන් පියසටහන | +26% |

**කාර්මික යෙදවුම්, විදුලිබල සහ බලශක්ති**

**උපාය මාර්ගික අවධාරණය**

අපනයන-අභිමුඛ ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කිරීම

ප්‍රාදේශීය ව්‍යාප්තිය

තිරසාර නවෝත්පාදනය

| | |
|---|---|
| පිරිවැටුම | +24% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +87% |
| බදුවලට පෙර ලාභය | +21% |
| මුළු වත්කම් | +4% |
| ආර්ථික අගය නිර්මාණය | +69% |
| කාබන් පියසටහන | -14% |

**ප්‍රවාහනය සහ සැපයුම්**

**උපාය මාර්ගික අවධාරණය**

ජාත්‍යන්තර නියෝජනය පුළුල් කිරීම

නායකත්ව හැකියාවන් වර්ධනයි

ඇඩ්වාන්ටිස් නිෂ්පාදන කළඹ ශක්තිමත් කිරීම

| | |
|---|---|
| පිරිවැටුම | +94% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +87% |
| බදුවලට පෙර ලාභය | +38% |
| මුළු වත්කම් | +3% |
| ආර්ථික අගය නිර්මාණය | +58% |
| කාබන් පියසටහන | -26% |

**වෙනත්**

**උපාය මාර්ගික අවධාරණය**

ෆෙන්ටන්ස්: සූර්ය පැනල

HBSIL: නව වෙළඳපොළ සහ සේවා

| | |
|---|---|
| පිරිවැටුම | +46% |
| බදු පොලීවලට පෙර ඉපැයීම් | +47% |
| බදුවලට පෙර ලාභය | -14% |
| මුළු වත්කම් | +5% |
| ආර්ථික අගය නිර්මාණය | +34% |
| කාබන් පියසටහන | +26% |

අඛණ්ඩ කලාපීය ව්‍යාප්තියක් දක්නට ලැබෙන කාර්මික යෙදවුම් උප අංශය මත රඳා පවතී. අංශය විසින් රබර් සහ ප්ලාස්ටික් කර්මාන්තවල නව පාරිභෝගිකයින් ඇති කර ගැනීම සඳහා අපනයන-අභිමුඛ ව්‍යාපාර පුළුල් කිරීම සඳහා කටයුතු කරන ලදී. එපමණක් නොව, අදාළ ගාස්තු පහළට සංශෝධනය කිරීම මූලික කොට ගෙන, විදුලිබල හා බලශක්ති අංශය විසින් බදු පෙර ලාභය රු. මිලියන 539.30 ක් ලෙස 34% කට ආසන්න පහළ වැටීමක් වාර්තා කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ යථා තත්ත්වයට පත් වෙමින් තිබෙන කාර්මික ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන, වඩාත් හිතකර සාර්ව ආර්ථික දැක්ම මඟින් මධ්‍ය කාලීනව පුනර්ජීවනයක් අපේක්ෂා කරනු ලබයි. එසේ වුවද, කෙටි කාලීනව කාර්මික යෙදවුම් සඳහා ඉල්ලුම අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම උප අංශය විසින් නිෂ්පාදන කළඹ සඳහා නව යෙදුම් හඳුන්වා දීම කෙරෙහි අවධානය යොමු කරයි. එමෙන්ම උපායමාර්ගික අවශ්‍යතාවයක් ලෙස කලාපීය වශයෙන් සිය වෙළඳපොළ නියෝජනය සහතික කරනු ඇත. මෙම අංශයේ සුවිශේෂී වර්ධන අවස්ථාවන් ඇති කරලීම සඳහා රජය විසින් පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම හේතු වනු ඇත.

### පාරිභෝගික සහ විකුණුම්

මෙම වර්ෂය පාරිභෝගික සහ විකුණුම් අංශය සඳහා විවිධාකාර අභියෝග සහිත වසරක් වූ අතර, ඉල්ලුම් සහ සැපයුම් අංශයන්හි අහිතකර වෙනස්වීම් හේතුවෙන් පිරිවැටුම 24% කින් පහත වැටිණි. ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ ආනයනික භාණ්ඩවල මිල ඉහළ යාමත්, පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩුවීමත් හේතුවෙන් ඉල්ලුම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති විය. මේ සඳහා විශේෂයෙන් ආනයනික නිෂ්පාදනවල විකල්ප පැවතීම හේතු විය. භාණ්ඩ තොග චක්‍රයේ ක්‍රියාවලිය දීර්ඝ වන විට, ඉහළ පොලී අනුපාත තත්ත්වය අංශයේ ණය ගැනීමේ පිරිවැය කෙරෙහි තියුණු බලපෑමක් ඇති කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසර තුළ බදු පෙර ලාභය රුපියල් මිලියන 690.81 දක්වා 88% කින් අඩු විය.

විශ්වසනීය පාරිභෝගික භාණ්ඩ සැපයුමේ වෙළඳපළ ප්‍රමුඛයා ලෙස සිංගර් සමාගමට නිරන්තරයෙන් කටයුතු කිරීමට සිය සුවිශේෂී නිෂ්පාදන කළඹ, පුළුල් භූගෝලීය පිය සටහන සහ ස්ථිරසාර සන්නාමය හේතු විය. 2023 SLIM-KANTAR ජනතා සම්මාන උළෙලේදී සිංගර් අඛණ්ඩව 17 වෙනි වරටත් රටේ ප්‍රමුඛතම සන්නාමයක් ලෙස පිළිගැනීමට ලක්වූ අතර වසරේ කීර්තිමත් ජනතා සන්නාමය ලෙස සම්මානයට පාත්‍ර විය.

විශේෂයෙන් නිෂ්පාදනවල විකල්ප පිළිබඳ සලකා බලන විට, නව බදු ක්‍රමය සහ ඊට උපයෝජ්‍ය ආදායමේ බලපෑම, රටේ කල් පවත්නා පාරිභෝගික නිෂ්පාදන කර්මාන්තයට බලපෑම් ඇති කරනු ඇත. අපේක්ෂිත සාර්ව-ආර්ථික තත්ත්වයන්හි ප්‍රතිසාධනයට අනුව, ඉල්ලුම් තත්ත්වයන් වසරේ දෙවන භාගය වන විට ක්‍රමයෙන් වැඩි දියුණු වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. කෙටි කාලීනව, සිංගර් සමාගම විසින් විකුණුම්හි තීව්‍ර වර්ධනයක් ඇති කිරීමෙන් පවතින භාණ්ඩ තොග මට්ටම් ප්‍රශස්ත කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත; සිංගර් සමාගමේ සියලුම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වෙතින් අසමසම පාරිභෝගික අත්දැකීමක් ලබා දීම හරහා ගෝලීය මට්ටමේ සන්නාමයක් ගොඩනැගීම, මධ්‍ය කාලීන - දිගු කාලීන සැලසුම මඟින් සිදු කරනු ලැබේ.

### සංචාරක කටයුතු

ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය අඛණ්ඩව සිව් වන වරටත් අභියෝගාත්මක වසරකට මුහුණ දුන් අතර, රටේ ආර්ථික අර්බුදය, සමාජ නොසන්සුන්තාව සහ දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීම් හි විශාල පසුබෑමක් ඇති විය. මෙම අංශයද සේවකයින් විදේශ රැකියා අවස්ථා වෙත ආකර්ෂණය වීමෙන් කුසලතා ගලනය ඉහළ යාම නිසා සැලකිය යුතු බලපෑමකට ලක් විය. මෙකී පසුබිම තුළ සමූහයේ තරු පහේ නාගරික හෝටල් වන කිංග්ස්බරි සහ අමායා නිවාඩු නිකේතන ජාලයෙහි දේශීය සංචාරකයින් සඳහා වන පිරිනැමීම් මෙන්ම විවිධ ආහාර හා පානවර්ග පිරිනැමීම් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. පැවති වාතාවරණය තුළ වුවද, මෙම අංශය සිය ආදායමේ 96% ක වර්ධනයක් වාර්තා කරන ලදී. මූලික කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා පිරිවැය කළමනාකරණය සහ ඵලදායිතාව උසස් කිරීම සිදු කරනු ලැබිණි. කෙසේ වෙතත්, පොලී අනුපාතවල තියුණු වැඩිවීම හේතුවෙන් බදු පෙර අලාභය රුපියල් බිලියන 2.43 දක්වා 43% කින් වැඩි වූ අතර එමඟින් මූල්‍ය පිරිවැය ආසන්න වශයෙන් දෙගුණ විය.

පසුගිය වසර කිහිපය තුළ, කිංග්ස්බරි සහ අමායා නිවාඩු නිකේතන ජාලය යන ද්විත්වයම ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවා පිරිනැමීම ශක්තිමත් කිරීමට කටයුතු කර ඇත. පාරිභෝගික තෘප්තිමත්භාවයේ අඛණ්ඩ වර්ධනය කිරීමට පුළුල් පාරිභෝගික අත්දැකීම් හේතු විය.

කර්මාන්තය යළි ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්නුම් කිරීමත් සමඟ පසුගිය මාස කිහිපය තුළ සංචාරක පැමිණීම්වල ධනාත්මක වර්ධනයක් දක්නට ලැබුණි. සමූහයේ සංචාරක අංශය එකී ප්‍රතිසාධනයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට අරමුණු කරයි. ඊට පුද්ගලයින් සහ නිෂ්පාදන වෙනුවෙන් ආයෝජන කිරීම හරහා එහි පිරිනැමීම ශක්තිමත් කිරීමට මෑත කාලීනව කටයුතු කරනු ලබයි. දෙස් විදෙස් ආගන්තුකයන් අතර මනා සමතුලිතතාවයක් පවත්වා ගැනීමටත්, එමඟින් වඩාත් ඔරොත්තු දෙන ක්‍රියාවලියක් ගොඩනැගීමටත් මෙම අංශය නිරන්තරයෙන් උත්සාහ කරනු ඇත.

### ඉදිකිරීම් ද්‍රව්‍ය

ඉහළ පොලී අනුපාත, උද්ධමනය, යෙදවුම් ද්‍රව්‍යවල පිරිවැයේ හිඟය හේතුවෙන් ඉහළ ගිය ගොඩනැගිලි ද්‍රව්‍ය පිරිවැයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම පහත වැටීමත් සමඟ වසර තුළ රටේ ඉදිකිරීම් කර්මාන්තය තියුණු පසුබෑමක් වාර්තා කළේය. මෙම පසුබෑම නොතකා, ඇලුමෙක්ස් සමාගම අපනයන වෙළඳපොළ වෙත යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එහි ආදායම රුපියල් බිලියන 10.12 දක්වා වූ 6% ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, ඉහළ භාණ්ඩ තොග මට්ටම් මධ්‍යයේ ණය ගැනීම් ඉහළ යාම මූල්‍ය පිරිවැය ඉහළ යාමට හේතු විය. එය ලාභදායිතාවයට අහිතකර ලෙස බලපෑ අතර, වසර තුළ බදු පෙර ලාභය රුපියල් මිලියන 153.54 දක්වා 89% කින් පහත වැටීමට හේතු විය.

අපනයන වෙළඳපොළවල අවස්ථාවන් ගවේෂණය හරහා දේශීය වශයෙන් සිදු වූ තියුණු පහත වැටීම තරමක් දුරට සමනය කර ගැනීමට මෙම අංශයට හැකි විය. පවතින අහිතකර කර්මාන්ත තත්ත්වයන් මධ්‍යයේ වුවද, "Ozon" සන්නාමය හඳුන්වා දීමත් සමඟ සිය නිෂ්පාදන කළඹ ඉහළ නැංවීමේ සැලකිය යුතු ප්‍රගතියක් ඇලුමෙක්ස් සමාගම විසින් අත්කර ගෙන තිබේ. වසර තුළදී, අංශය ඕස්ට්‍රේලියාවේ විශාලතම හිමිවත් පද්ධතිය සඳහා නිෂ්පාදන හිමිකම්ද ලබා ගත් අතර එමඟින් එහි නිෂ්පාදන කළඹ තවදුරටත් පුළුල් විය.

ඉදිකිරීම් අංශය කෙටි කාලයකට අකර්මණ්‍යව පවතිනු ඇතැයි අපි අපේක්ෂා කරමු. වෙළඳපොළ පොලී අනුපාතවල අපේක්ෂිත අඩුවීම සහ අභිප්‍රායයන් ක්‍රමයෙන් වැඩිදියුණු වීම හේතුවෙන් වසරේ දෙවන භාගය වන විට එය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වනු ඇතැයි බලාපොරොත්තු වේ. ඇලුමෙක්ස් සමාගම විසින් සිය නිෂ්පාදිත සහ නිෂ්පාදන හැකියාවන් පුළුල් කරමින් ඉදිකිරීම් අංශයේ ප්‍රතිසාධනයක් අපේක්ෂා කරයි. නිෂ්පාදන කළඹ පුළුල් කිරීමේ අඛණ්ඩ ප්‍රයත්නයන් දරන අතර, දේශීය හා අපනයන වෙළෙඳපොළ තුළට පිවිසීමට පුළුල් උපායමාර්ග ක්‍රියාත්මක කරනු ඇත.

### වෙනත්

සමූහයේ මෙම අංශය ෆෙන්ටන්ස් සමූහය, සීමාසහිත හේලීස් බිස්නස් සොලියුෂන්ස් ඉන්ටර්නැෂනල් සමාගම (HBSIL) සහ හේලීස් පීඑල්සී හි සමූහ සේවාවලින් සමන්විත වේ. වසරේ දෙවන භාගයේදී ෆෙන්ටන්ස් සමූහයේ ප්‍රතිසාධනය, HBSIL සමාගමේ ශක්තිමත් නැගී සිටීම සහ හේලීස් පීඑල්සී හි ඉහළ ලාභාංශ හේතුවෙන් වසර තුළදී මෙම අංශය 46% ක ආදායම් වර්ධනයක් පෙන්නුම් කළේය. රට තුළ දීර්ඝ විදුලි කප්පාදු කිරීම් සිදු වූ කාලයක සූර්ය බලය සහ බලශක්ති ගබඩා විසඳුම් සඳහා ඉල්ලුම ඉහළ යන ලදී. මෙහෙයුම් ක්ෂේත්‍රයේ අභියෝග රැසක් මධ්‍යයේ වුවද එකී ඉල්ලුම සපුරාලීමට ෆෙන්ටන්ස් සමූහය කටයුතු කළ අතර ඒ හරහා ප්‍රශංසනීය ලාභ වර්ධනයක් වාර්තා කළේය. ෆෙන්ටන්ස් සමූහය මෙම වෙළඳපළ අවකාශය තුළ සිය ස්ථාවරය ශක්තිමත් කර ගනිමින් රට තුළ සූර්ය බලශක්ති විසඳුම්වල වෙළඳපළ ප්‍රමුඛයා ලෙස කටයුතු කරනු ලැබිණි. මේ අතර, ප්‍රධාන වෙළඳපොළවල්හි BPO මෙහෙයුම් වැඩි වීම සහ ඩිජිටල් සේවා කළඹ පුළුල් කිරීම හේතුවෙන් HBSIL විසින් ආදායම් සහ ලාභදායිතාවයේ ශක්තිමත් වර්ධනයක්ද වාර්තා කර ඇත. මේ අතර, වසර තුළ සිය සමූහයේ සමාගම්

# සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය

වෙතින් සිදු වූ ලාභාංශ ඉහළ නැංවීම හේතු කොට ගෙන ශක්තිමත් මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට හේලීස් පීඑල්සී සමාගමට හැකි විය. කෙසේ වෙතත්, අනෙකුත් අංශයට අදාළව බදු පසු ලාභය රුපියල් බිලියන 3.67 දක්වා 19% කින් පහත වැටීමක් වාර්තා විය. වසර තුළ බදු ගෙවීම්වල සිදු වූ තියුණු ඉහළ යාම ඊට ප්‍රධාන වශයෙන් හේතු විය.

**කොටස්හිමි වටිනාකම**

සමූහය විසින් එහි කොටස් හිමියන්ගේ වගකීම් අඛණ්ඩව ඉටු කරන ලද අතර, වර්ෂය තුළ කොටසකට ඉපැයීම් රුපියල් 21.80 කි. අපි 2023 මාර්තු මාසයේදී කොටසකට රුපියල් 5.35 ක අතුරු ලාභාංශයක් ප්‍රකාශයට පත් කළ අතර එය පෙර වසරට සාපේක්ෂව 34% ක වැඩිවීමකි.

හේලීස් පීඑල්සී සමාගමෙහි කොටසක මිල 2022 අප්‍රේල් මාසයේදී රුපියල් 76.90 සිට රුපියල් 151.50 දක්වා ඉහළ ගියේය. කොටසක වසර අවසාන මිල වූයේ රුපියල් 72.00 කි.

**නව අපේක්ෂාවන්**

මෙය තීරණාත්මක කාලපරිච්ඡේදයක් වන අතර එය අපගේ සමාජ-ආර්ථික සංවර්ධනය වඩාත් ශක්තිමත්, සාධාරණ මෙන්ම තිරසාර කිරීමට මනා පිටුබලයක් වනු ඇතැයි මම සැබවින්ම විශ්වාස කරමි. සාර්ව-ආර්ථික ස්ථාවරත්වය යළි ඇති කිරීම සඳහා වන මෑත කාලීන ප්‍රතිපත්ති මඟින් රටේ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වනු ඇත. රටේ ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේ මාවතකට යොමු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම අනුමත කිරීම හේතු වී ඇත. නායකත්වයේ අභිමතය සහ අධිෂ්ඨානය මත මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පවත්වා ගෙන යාමත්, වත්මන් අර්බුදයෙන් අවදානමට ලක් වන පිරිස් වෙත සහන සැලසීමත්, ඉහළ වගවීමක් සහ විනිවිදභාවයක් කරා මෙහෙයවීමත් කාලීන අවශ්‍යතා වේ. මෙම ස්ථාවරත්වය සහ දිගු කාලීන ඔරොත්තු දීමේ හැකියාව සාක්ෂාත් කර ගැනීම සඳහා රජය, පෞද්ගලික අංශය සහ මහජනතාවගේ සාමූහික කැපකිරීම් අවශ්‍ය වේ. සංවිධානයක් ලෙස රටේ ආර්ථික පුනර්ජීවනයට සහ සමෘද්ධියට අපි සහය දක්වන්නෙමු.


නැගී එන වෙළඳපොළවල් සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට සෘණාත්මක පාරිභෝගික අභිප්‍රායයන්, අඩු ගෘහස්ථ වියදම් සහ විභව ප්‍රාග්ධන පිටතට ගලා යාම හේතුවෙන් බලපෑම් ඇතිවිය හැකි අතර, ඒ අනුව ගෝලීය වර්ධනය 2023 වර්ෂයේදී පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සාර්ව-ආර්ථික මූලධර්ම මධ්‍ය-දිගු කාලීන වශයෙන් ක්‍රමානුකූල දියුණුවක් අපේක්ෂා කරයි. බාහිර බලපෑම් අවම කිරීම සහ සැපයුමෙහි ඇති වන වෙනස්වීම් සාමාන්‍යකරණය වීම හේතුවෙන්, උද්ධමන පීඩනය ඉදිරි මාසවලදී ක්‍රමයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑත මාසවල පොලී අනුපාතවල පහළ යාමේ ප්‍රවණතාව අනුව එහි ක්‍රමික අඩුවීමක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමඟින් උද්ධමනය ලිහිල් කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවලට අදාළ ඉහළ අවදානම් වාරික අඩුවීම පිළිබිඹු කරනු ලබයි. විදේශ අංශයේ ක්‍රියාකාරකම්වල අපේක්ෂිත වැඩිදියුණු කිරීම් සහ සාර්ව-ආර්ථික ස්ථාවරත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම මඟින් 2023 වසර අග භාගය වන විට ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බාධා පැමිණෙන්නේ අවස්ථාවන් උදා කරමිනි. එබැවින් කෙටි කාලීනව ඇති වන නොවැළැක්විය හැකි අභියෝග හමුවේ අපි නොසැලී ශුභවාදීව කටයුතු කරමු. ශුභවාදීව කටයුතු කිරීම නොසැලෙන නායකත්ව ලක්ෂණයක් යැයි අපි තරයේ විශ්වාස කරන්නෙමු. එමෙන්ම අපගේ සම්පත්, හැකියාවන්, පුද්ගලයන් සහ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සඳහා අප ගෙන ඇති පියවරයන් ඇති වන අභියෝගයන් සඳහා සාර්ථකව මුහුණ දීමට උපකාරී වනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු. අපි ශුභවාදී සහ බලාපොරොත්තු පෙරදැරි කරගත් අනාගතයක් අපේක්ෂා කරන්නෙමු. නවෝත්පාදනය, වෙළඳපළ සංවර්ධනය, පාරිභෝගිකයින් අත්පත් කර ගැනීම සහ මෙහෙයුම් විශිෂ්ටත්වය ආදි ප්‍රධාන උපායමාර්ග යන් ඊට ශක්තියක් වනු ඇත.

**ස්තුතිය**

මෙම වාර්තාවේ දැක්වෙන කැපීපෙනෙන කාර්යසාධනය හේලීස් පවුලේ විවිධ අංශයන් හි උනන්දුවේ සහ කැපවීමෙහි ප්‍රතිඵලයන් වේ. නිරන්තරයෙන් ගුණාත්මක ප්‍රමිතියක් පවත්වා ගැනීම වෙනුවෙන් මෙන්ම ශ්‍රී ලංකාවේ අංක එකේ ආයතනයක් බවට හේලීස් ආයතනය පත් කිරීම වෙනුවෙන් අප කණ්ඩායම වෙත අධ්‍යක්ෂ මණ්ඩලය මෙන්ම මමද ස්තුතිය පළ කර සිටිමි. උප සභාපති ලෙස කටයුතු කරමින් සිට 2022 ජුනි මස අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විශ්‍රාම ගන්නා ලද ධම්මික පෙරේරා මහතා වෙත මාගේ විශේෂ ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. පෙරේරා මහතාගේ දැක්ම මෙන්ම වටිනා උපදේශන, මෑත වසරයන්හි සමූහයේ නිරන්තර සාර්ථකත්වය උදෙසා ප්‍රධාන දායකත්වයක් සැපයූ අතර, ඔහුගේ ඉදිරි අපේක්ෂාවන් සඳහා මම සුබ පැතුම් එක් කරන්නෙමි. එමෙන්ම සමාලෝචනය වනු ලබන වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් වූ කෞෂි අමරසිංහ මහත්මියටද මම ස්තුතිය පළ කර සිටිමි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දුෂ්කර වසරකට මුහුණ දීම සඳහා ඉදිරි දැක්මක් සහිතව සැලකිලිමත්භාවයෙන් කටයුතු කිරීම වෙනුවෙන් මම ස්තුතිය පළ කර සිටිමි. එමෙන්ම මෙම ගමනේ අප සමඟ අත්වැල් බැඳගත් කොටස්හිමියන්, පාරිභෝගිකයින්, සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන් විසින් දක්වන ලද විශ්වාසය සහ බලාපොරොත්තුව මම අගය කරමි.



**මොහාන් පණ්ඩිතගේ**
සභාපති සහ ප්‍රධාන විධායක
2023 මැයි 19 වන දින